# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස් /தொலைநகல்: 011-2868426
*website : www.elections.gov.lk*

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත, රාජගිරිය. (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)
*e-mail : info@elections.gov.lk*


මගේ අංකය : **TR/PRE/CIR/2024** ඔබේ අංකය : දිනය : **2024.08.21**
எனது இல. : உமது இல : திகதி:

**හදිසි / ඉතා වැදගත්**

සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් සහ
නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත.

**<u>ජනාධිපතිවරණය - 2024.09.21</u>**
**<u>දිස්ත්‍රික් වාහන අවශ්‍යතාව.</u>**

2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමේ රාජකාරී සඳහා ඔබට වාහන විශාල ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත. ඒ සඳහා ඔබ දිස්ත්‍රික්කය තුළ රජයේ වාහන හඳුනාගැනීම පිළිබඳව සංගණනයක් කරන ලෙස දැනටමත් මවිසින් ඔබ වෙත දන්වා ඇත.

02. තවද, ඔබ දිස්ත්‍රික්කයේ වාහන අවශ්‍යතාවය සහ එය සපුරාගන්නා ආකාරය පිළිබඳ තොරතුරු මීට අමුණා ඇති ආකෘතිය මගින් කඩිනමින් අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත දන්වා එවන්න. ඔබ විසින් කරනු ලබන දිස්ත්‍රික් වාහන සංගණනයට අනුව, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ, පෞද්ගලික බස්රථ සහ කුලී පදනම මත ලබාගන්නා වාහන මගින් ඔබගේ අවශ්‍යතාව සපුරා ගැනීමට කරුණාකර කටයුතු කරන්න.

03. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ (චක්‍රලේඛ අංක PRE/2024/41 - TR 06) , පෞද්ගලික බස්රථ (චක්‍රලේඛ අංක PRE/2024/42 - TR 07) සහ කුලී පදනම මත ලබා ගන්නා වාහන (චක්‍රලේඛ අංක PRE/2024/40 - TR 05) වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු පිළිබඳ විස්තර දැනටමත් ඔබ වෙත එවා ඇත.

04. එසේම ඡන්ද විමසීමේ මූලික සංවිධාන කටයුතු සඳහා රජයේ වාහන කිහිපයක් අනුයුක්ත කර ගත හැකි අතර ඒ සඳහා කිසිවිටකත් කුලී පදනම මත වාහන ලබා නොගත යුතුය. තවද සංස්ථා, අධිකාරී හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල රියදුරන්ගේ අතිකාල ගාස්තු ඉතා ඉහළ මට්ටමක පවතින බැවින් අධික වැය බරක් රජයට දැරීමට සිදුවන හෙයින් එම වාහන මූලික සංවිධාන කටයුතු සඳහා යොදා නොගැනීමට කරුණාකර කටයුතු කරන්න.

2 වන පිටුවට

05. ඉහත සඳහන් ආකාරයෙන් ලබා ගන්නා වාහන අවශ්‍යතාවය පිළිබඳ විස්තර මේ සමඟ ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කර නොපමාව මාවෙත එවන ලෙස කාරුණිකව දන්වමි. එසේම වාහන සංගණනයට අනුව දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් ඔබ දිස්ත්‍රික්කය තුළ නොමැතිනම් පමණක් කොළඹ සංචිතයෙන් ලබා ගැනීමට අපේක්ෂිත වාහන ප්‍රමාණය කොපමණද යන්න එම ඇමුණුමෙහි ඇතුළත් කිරීමට කටයුතු කරන්න. එහෙත් කොළඹ සංචිතයෙන් ලබාදිය හැකි වාහන ප්‍රමාණය ඉතා සීමිත බවද කරුණාකර සටහන් කරගන්න.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්,

*පිටපත් :*
1. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව
2. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
3. ප්‍රධාන මූල්‍ය නිලධාරි
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක

(3, 4) කාරුණික දැන ගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා.

3 වන පිටුවට

සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி :011-2868444
ෆැක්ස්/தொலைநகல் :011-2868445
*e-mail : chairman@elections.gov.lk*

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல் :011-2885208
*e-mail: cge@elections.gov.lk*

අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන)
மேலதிக தேர்தல்கள் ஆணையாளர் (நிர்வாகம்)
දුරකථන/தொலைபேசி: 011-2868086
ෆැක්ස්/தொலைநகல் : 011-2885228
*e-mail: addy.com.admin@elections.gov.lk*

ෆැක්ස් අංකය : 011-2868426
Email – ectransportb@gmail.com

## ජනාධිපතිවරණය - 2024.09.21
## වාහන අවශ්‍යතාවය ................................ දිස්ත්‍රික්කය

| | කාර් | වෑන් | ජීප් | කැබ් | බස්රථ අවශ්‍යතාව | | කෘෂ කැබ් | ලොරි | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ආසන 40ට වැඩි | ආසන 40 ට අඩු | | | |
| සමස්ථ වාහන අවශ්‍යතාව | | | | | | | | | |
| දිස්ත්‍රික්කයේ රජයේ ආයතන වෙතින් වෙන් කර ගත හැකි වාහන | | | | | | | | | |
| කුලී පදනම මත ලබාගන්නා වාහන | | | | | | | | | |
| ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් ලබාගන්නා බස්රථ | | | | | | | | | |
| පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයෙන් ලබාගන්නා බස්රථ | | | | | | | | | |
| කොළඹ සංචිතයෙන් අපේක්ෂිත වාහන ප්‍රමාණය | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

...........................................................
නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් අත්සන
නිල මුද්‍රාව

සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන)

නම : ...........................................................

දුරකථන අංකය : ...........................................................

ෆැක්ස් අංකය : ...........................................................

ජංගම දුරකථන අංකය : ...........................................................

ආදර්ශ අත්සන : ...........................................................

---

### ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

| | කාර් | වෑන් | ජීප් | කැබ් | කෘෂ කැබ් | ලොරි |
|---|---|---|---|---|---|---|
| කොළඹ සංචිතයෙන් ලබාදිය හැකි ප්‍රමාණය | | | | | | |